**හෝමාගම ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

හෝමාගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| 1.2.1(ඇ) | භෞතිකව නොමැති රු.2,531,143 ක් වටිනා ගබඩා භාණ්ඩ, ගබඩා තොග වශයෙන් තොග ගිණුමෙහි සටහන්කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වර්ෂය අවසාන දිනට භෞතික තොග ශේෂය ගණනය කර ගිණුම්වල දැක්විය යුතුය. |
| 1.2.2 | විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා උපයෝගී පොත්/උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 104,342,543 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | **අදාළ ප්‍රමිතියට අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 3.9 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත තොරතුරු, එනම් මුල් අයවැය, අවසාන අයවැය සහ ඒ අතර ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් ඒවාට හේතු හෙළිදරව් කිරීම් ආදිය සිදුකර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ආ) | 6 වගන්තිය ප්‍රකාරව 2020 වර්ෂයට පෙර ඉදිකරන ලද මංමාවත් බෝක්කු හා පාලම් වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු අතර | පිළිගනිමි. | චක්‍රලේඛ ප්‍රකාරව වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි 2020 වර්ෂයට පෙර ඇති සියළුම |

| | | | |
|---|---|---|---|
| | 2020 වර්ෂයේදී ඉදිකරන ලද මංමාවත්, බෝක්කු හා පාලම් සඳහා තක්සේරු කර ඇති වටිනාකම පමණක් දේපළ, පිරියත හා උපකරණ යටතේ රු.240,360,314 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | දේපළ, පිරියත හා උපකරණ ලේඛනගතකර ගිණුම්ගත කල යුතු වේ. |
| (ඇ) | 4.6 වගන්තිය ප්‍රකාරව ඉඩම්, ගොඩනැගිලි හා පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රමිත ප්‍රකාරව ඉඩම්, ගොඩනැගිලි හා පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කල යුතු වේ. |
| (ඈ) | 9.9 වගන්තිය ප්‍රකාරව වෙනත් විස්තීරණ ආදායම් තුළ ඇති අයභාරවල තෘප්ත නොකරන රජයෙන් වන පැවරුම් ස්කන්ධයේ වෙනම සංරචක ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශයේ රු.189,378,640 ක බැරශේෂයක් ලෙස දැක්වුවද එම වටිනාකම හඳුනාගත් ආකාරය හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ඉ) | 10.9 වගන්තිය ප්‍රකාරව කෙරීගෙන යන කොන්ත්‍රාත් වැඩ සම්බන්ධයෙන් නිම කිරීමේ අදියර තීරණය කිරීම සඳහා භාවිතා කල ක්‍රමය හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ඊ) | 15.13 වගන්තිය ප්‍රකාරව සභාවේ හුවමාරුවන හා හුවමාරු නොවන ගණුදෙනුවල ලැබිය යුතු මුදල් අයකරගත නොහැකි ලෙස ලියාහැරීමේ යම් වටිනාකම් හා ඒ සඳහා අනුමැතිය වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රමිත ප්‍රකාරව අනුමැතිය ලබා ගත යුතු වේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකමරු. 4,903,770 ක් වූ ට්‍රේලර් රථ 21 ක්, කුබෝටා රෝද හතරේ ට්‍රැක්ටර් රථයක්, පාපැදි 04 ක්, ත්‍රී රෝද රථයක් කසළ කරත්ත 06 ක් සහ වටිනාකම සොයා ගත නොහැකි ට්‍රේලර් රථයක් සහ පරිත්‍යාග වශයෙන් ලද කම්පැක්ටර් රථයක් ප්‍රත්‍යාගණනය කර දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | නිවැරදිව සියලුම වාහන හා යන්ත්‍ර ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී කෙරීගෙන යන වැඩවල රු.188,287,828 ක් වූ මංමාවත්, බෝක්කු හා පාලම් ලෙසත් වැඩ ආරම්භකර ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි 7 ක වටිනාකම රු.36,028,069 ක් ගොඩනැගිලි ලෙසත් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ඇ) | ණයහිමියන් ලෙස ගිණුම්ගත කර ඇති පරිගණක රු.526,500, කාර්යාල උපකරණ රු.115,155, සවිකිරීම් රු.15,444, ලීබඩු රු.1,383,050 ක් හා ගිනි ආරක්ෂණ ඇඳුම් කට්ටල රු.60,390 ක් කෙරීගෙන යන වැඩ වෙනුවට දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ඈ) | පළාත් සභා කර්මාන්ත ණයහිමි රු.6,675,117 ක් ද, පොදු කර්මාන්ත ණයහිමි රු.42,060,855 ක් ද, සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ වෙනුවට පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පොදු කර්මාන්ත ණය හිමි වටිනාකම වන්නේ රු. 42.060,854 ක් බව පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ඉ) | 2020 වර්ෂයේදී රු.4,640,000 කට මිලදී ගන්නා ලද ටිපර් රථයක් ප්‍රත්‍යාගණනය කර තිබූ අතර නැවතත් 2020 වර්ෂය තුලදී එකතු කිරීම් යටතේ ද රු.4,268,800 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මෝටර් රථ වටිනාකම රු.4,268,800 ක් හා මේ සඳහා ක්ෂය කිරීමේදී රු.185,600 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබුණු වටිනාකම රු.66,580ක් වූ පුස්තකාල පොත් පරිත්‍යාග ලැබීමක් වෙනුවට සංචිත හා වෙන් කිරීමේ ගිණුමට බැර කිරීම නිසා ස්කන්ධය වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්ථන නොවන වියදම් සඳහා වන රජයෙන් කළ මාරු කිරීම් වටිනාකම රු.18,290,398 ක් වුවත් එය රු.189,378,639 ක් ලෙසත් වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන රු.171,088,241 ක් වුවත් එය රු. 189,378,639 ක් ලෙසත් ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් විස්තීරණ ආදායමේ හඳුනා ගත යුතු ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.18,290,390 ක් බව පිළිගනිමි. | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. |
| (ඌ) | සභාවේ අබලි භාණ්ඩ ගබඩාවේ 2015 මාර්තු 25 දින ගින්නෙන් සිදු වූ රු.2,177,441 ක් වූ අලාභයෙන් අදාල ආරක්ෂක අංශයෙන් තවදුරටත් අයවිය යුතු රු.612,895 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | 2017 වර්ෂය තුළ ගබඩාවට ලද කායවර්ධන උපකරණ සඳහා ණයගිම් වෙන්කර නොමැති වීම හා එම උපකරණ වෙනුවෙන් 2018 වර්ෂයේදී පළාත් සභා ගබඩා අත්තිකාරම් යටතේ රු.4,586,387 ක් ගෙවීම් කර තිබීම හේතුවෙන් සිදු වී ඇති වැරද්ද නිවැරදි නොකිරීම නිසා එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල වැඩියෙන් හා හඳුනා නොගත් ගබඩා ශේෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | හඳුනා නොගත් ගබඩා ශේෂ හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ඒ) | 2019 වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොළී රු.301,727 ක් සමාලෝචිත වර්ෂයේ පොළී ලෙස ගිණුම්ගත කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු පොළිය රු.215,364 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | වර්ෂයට අදාල තැන්පතු පොළී ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඔ) | 2020 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.1,499,952ක වටිනාකමින් යුත් කාර්යාල උපකරණ දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | නිවැරදිව දේපළ, පිරියත හා උපකරණ හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඕ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 4.6 පරිච්ඡේදය ප්‍රකාරව 2020 වර්ෂයට පෙර මිලදී ගෙන තිබූ යන්ත්‍ර, ලී බඩු හා කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | පිළිගනිමි. | සියලුම යන්ත්‍ර, ලී බඩු හා කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ක) | සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ මිලට ගැනීම් රු.61,671,945 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීම් රු.56,595,785 ක් ලෙස දැක්වීම නිසා මුදල් ගලායෑම් රු.4,712,160කින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ග) | සමාලෝචිත වර්ෂයේ මුදලින් ලද පොළී ආදායම රු.7,465,952 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ පොළී ආදායම රු.5,938,407 ක මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි. | පිළිගනිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ච) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 4 පරිච්ඡේදය ප්‍රකාරව 2020 වර්ෂයට පෙර ඉදිකරන ලද මංමාවත් බෝක්කු හා පාලම් වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු අතර 2020 වර්ෂයේදී ඉදිකරන ලද මංමාවත්, බෝක්කු හා පාලම් සඳහා තක්සේරු කර ඇති වටිනාකම පමණක් දේපළ, පිරියත හා උපකරණ යටතේ රු.240,360,314 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | සියලුම මංමාවත්, බෝක්කු හා පාලම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයන් 10 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපයෝගී පොත්/ උපලේඛන අනුව වටිනාකම අතර රු.59,895,335 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. |

### 1.6.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාල පළාත් සභා හා පළාත් පාලන ණයගැති ශේෂ කපා හැරීම් රු.13,996,612 ක් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | පිළිගනිමි. | විධිමත් අනුමැතියක් ලබා ගත යුතු වේ. |
| (ආ) | සභා තීරණ නොමැතිව සමාලෝචිත වර්ෂයේදී රු.13,411,064 ක ණයහිමියන් කපාහැරිම් කර තිබුණි. | පිළිගනිමි. | විධිමත් අනුමැතියක් ලබා ගත යුතු වේ. |

### 1.6.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.118,024,519 ක් වූ ගිණුම් විෂයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | පිළිගනිමි | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කලයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.216,747,584 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.249,970,498 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු වරිපනම් රු.57,260,035 ක් වූ අතර එය අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | නිසි පරිදි හිඟ බදු අයකිරීමේ කටයුතු කිරීමට 2020 වර්ෂයේ පැවති කොවිඩ් වෛරස් වසංගත තත්ත්වය බලපෑ බව දන්වමි. | හිඟ ආදායම් කඩිනමින් රැස් කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව හිඟ බදු අයකර ගැනීම සඳහා විධානය කරමින් ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබූ බලපත්‍රයක් එහි නම සඳහන් ප්‍රාදේශීය සභාවේ මුදල් එකතු කරන්නෙකුට නිකුත් කළ යුතු වුවත් හිඟ හිටි බදු රු.17,150,019 කට අදාළව විනිග්‍රහ බලපත්‍ර නිකුත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | නිසි පරිදි හිඟ බදු අයකිරීමේ කටයුතු කිරීමට 2020 වර්ෂයේ පැවති කොවිඩ් වෛරස් වසංගත තත්ත්වය බලපෑ බව දන්වමි. | හිඟ බදු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | මාර්ග පලුදුවීම් සැකසීම වෙනුවෙන් ලැබී තිබූ අයදුම්පත්‍ර 3188 ක් වෙනුවෙන් ප්‍රාදේශීය සභාවට රු.9,148,179 ක ආදායමක් ලැබී තිබුනද, අයදුම්පත්වලින් සියයට 90 කට පමණ අදාළ මාර්ග සැකසීම් ප්‍රාදේශීය සභාව විසින් සිදුකර | ක්‍රමවත් ආකෘති පත්‍රයක් සකස් කර, පැමිණිලි සඳහා ක්‍රියාත්මක වීමට අවශ්‍ය විධිමත් ක්‍රමයක් සකස් කර ඒ අනුව කටයුතු කරමින් ඇත. | කඩිනමින් මාර්ග පලුදුවීම් සැකසීම කල යුතු වේ. |

නොතිබුණි. ඒ අනුව ආදායම් ඉපයුවද ඊට අවශ්‍ය සේවාව ප්‍රමාදයකින් තොරව මහජනතාවට සැපයීමට ප්‍රාදේශීය සභාව සමත්වී නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**<br><br>සභා බල ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 91 ක් ඇතත් ඉන් 50 කින් පමණ කසළ එකතු කරනු ලබයි. දිනකට කසළ ටොන් 35 ක් පමණ එකතු කරනු ලබන අතර එය වෙන්කිරීම් කර දිරන හා නොදිරන කසළ ලෙස හෝමාගම නගර මධ්‍යයේ පිහිටි දූව වත්ත කසළ අංගනය වෙත ගෙන එන අතර කොන්ත්‍රාත් ආයතනයක් මගින් කරදියානට ප්‍රවාහනය කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේ කසළ ප්‍රවාහය වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු. 13,626,864ක් හා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට රු.6,370,230 ක් ලෙස ගෙවීම් කර තිබුණි. ප්‍රාදේශීය සභා පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව කසළ කළමනාකරණය සම්බන්ධයෙන් වාර්ෂික සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සභාව සතු වාහන තිබියදී සෑම වර්ෂයකම කසළ ප්‍රවාහනය සඳහා රුපියල් මිලියන 20 ක් පමණ වැය වන බැවින් ඒ සඳහා සභාව ක්‍රමවත් වැඩ පිළිවෙලක් සැලසුම් කර නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණ සම්බන්ධව සැලැස්මක් සකස් කිරීමේදී ඒ සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ විශේෂඥ ආයතනවලද සහයෝගය ලබා ගැනීමට අවශ්‍ය පසුගිය වර්ෂවල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අතපසු වූ බැවින් මෙම වර්ෂයේ 2022 බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් පස්අවුරුදු සැලැස්මට සමගාමීව වාර්ෂික සැලැස්ම සකස් කරනු ලැබේ. සභාව සතු වාහන ග්‍රාම සේවා වසම් 91ක් තුළ කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් නොවූ අතර වෙනස් සේවාවන් සඳහාද, වාහන යොදා ගන්නේ ඉතාමත් අසීරුවෙනි. | කාර්යක්ෂම ලෙස ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කල යුතු වේ. |